# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,030 - 2017 ජූලි මස 28 වැනි සිකුරාදා - 2017.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

සංශෝධනයයි

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ආශ්‍රිත නිලධාරි ගණය සඳහා වන තනතුරුවලට විවෘත පදනම මත බඳවා ගැනීම
(ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි, ප්‍රචාරක නිලධාරි, සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී)

අංක 1,950 හා 2016.01.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 01-570 යටතේ පළවූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි ගණය සඳහා වන තනතුරුවලට විවෘත පදනම මත බඳවා ගැනීම (ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි, ප්‍රචාරක නිලධාරි, සූක්ෂම දර්ශක ඡායාරූප ශිල්පී) යන මැයෙන් 02 ඡේදයේ (I) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් යටතේ ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි තනතුරට අදළ අධ්‍යාපන සුදුසුකම් —

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම" ලෙස සංශෝධනය කරනු ලැබේ.

02. එබැවින් යථෝක්ත *ගැසට් නිවේදනයේ* ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි තනතුර සඳහා අදළ කොටස සහ අප වෙත ලැබී ඇති අයදුම්පත්‍ර අවලංගු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

03. ඒ අනුව ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරි තනතුර සඳහා පමණක් 2017.08.28 දිනය දක්වා නැවත අයදුම්පත් කැඳවනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින බව ද වැඩි දුරටත් දන්වා සිටිමි.

ජනක සුගතදස,
ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය.

07-1011

---

**ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය**

අභ්‍යන්තර විගණක

ඉහත ඇබෑර්තුව පිරවීම සඳහා යෝග්‍යතා පූර්ණ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අවම සුදුසුකම් :
බාහිර අයදුම්කරුවන් -

(1) කළමනාකරණ හෝ වාණිජ්‍ය විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබාතිබීම;
හෝ
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ (ICASL) අන්තර්මාධ්‍ය පරීක්ෂණය සමත් වීම;
හෝ
කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත්වීම;
හෝ
වරලත් සහතිකලත් ගණකාධිකරණ සංගමයේ (ACCA) අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත්වීම;
හෝ
ගණකාධිකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපනික ආයතනය
සහ
සුදුසුකම් ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබාතිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
(2) ''කණිෂ්ඨ කළමනාකාර'' JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. වැටුප :

1. *වැටුප් පරිමාණය* : MM 1-1-2006 A
රු. (53,175-10x1,375 - 15x1,910-95,575)
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 අනුව නව වැටුප් සංශෝධනයන්ට යටත්ව ගැලපුම් සිදු කරනු ලැබේ.

03. *පත්වීම් ස්වභාවය* :
තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි -
1. තනතුර ස්ථිරය;
2. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

04. *සේවා කොන්දේසිය* :
2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා රෙගුලාසිවලට අනුව යටත් විය යුතු ය.

05. *වයස් සීමාව* :
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පමණක් බඳවා ගැනීම් සිදු කෙරේ.

07. *අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය* :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අයදුම්කරුවන් විසින් පළපුරුද්ද අවශ්‍ය කාලය සපුරා තිබිය යුතුය.

08. *ඉල්ලුම් කරන දිනය* :
අයදුම්කරුවන් විසින් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2017.08.11 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

සුවින්ද එස්. සිංගප්පුලි,
අධ්‍යක්ෂ.

2017 ජූලි මස 13 වැනි දින,
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය,
2 වන මහල, ඩී කොටස,
සෙත්සිරිපාය - දෙවන අදියර,
බත්තරමුල්ල.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ
අභ්‍යන්තර විගණක තනතුර සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම

1. මුලකුරු සමග නම :————. මයා./මිය./මෙය.
2. සම්පූර්ණ නම :————.
3. ස්ථිර ලිපිනය :————.
4. දැනට පදිංචි ලිපිනය :————.
5. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]
6. දුරකථන අංකය : ස්ථාවර :——. ජංගම :——.
7. උපන් දිනය :
අවුරුද්ද :———. මාසය :———. දිනය :———.
8. වයස (2017.08.11 දිනට) :
අවුරුදු :———. මාස :———. දින :———.
9. ජාතිය :———.
10. විවාහක/අවිවාහක භාවය :
විවාහක ☐ අවිවාහක ☐ (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)
11. ඔබ ඉල්ලුම් කරනු ලබන්නේ සුදුසුකම් :
1 යටතේ ද? ☐ 2 යටතේ ද? ☐
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)
12. උපාධිය පිළිබඳ විස්තර :
I. විශ්ව විද්‍යාලය :————.
II. උපාධිය ලබාගත් දිනය :————.
III. විශේෂ/සාමාන්‍ය :————.
IV. මාධ්‍ය :————.
V. පන්තිය : පළමුවන/දෙවන ඉහල/ දෙවන පහල :————.
13. උපාධිය ලබා නොමැතිනම් ලබා ඇති අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර :
..........................................................
..........................................................
14. *සේවා පළපුරුද්ද* :
I. දැනට දරණ තනතුර :————.
II. ස්ථිර කළ දිනය :————.
III. දැනට සිටින ශ්‍රේණිය :————.
IV. එම ශ්‍රේණියට පත් වූ/උසස් වූ දිනය :———.
V. 2017.03.24 දිනට සේවා කාලය :————.
15. *අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද* :
......................................................
......................................................
......................................................
16. වෙනත් අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා) :
......................................................
......................................................
......................................................
17. භාෂා ප්‍රවීනත්වය නියමිත කොටුවේ (✓) යොදන්න :

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

*අයදුම්කරුගේ ප්‍රකාශය*

.................................................. වන මා මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමට අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

තවද, මා මීට ප්‍රථම රාජ්‍ය සේවයෙන් අස්කර හෝ අකාර්යක්ෂමතාවය හේතුවෙන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමකට ලක්කර හෝ සේවය අතහැරගිය අයෙකු සේ සලකා නොමැති බව ප්‍රකාශ කරමි.

මා මෙම තනතුර සඳහා තෝරගනු ලැබීමෙන් පසුව මා නුසුදුස්සෙකු යයි සනාථ වුවහොත් සේවයෙන් පහකිරීමට ලක්වීමට මම බැඳී සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරු රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවය කරන්නේ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය*

............................මයා ................. අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ස්ථිර/ තාවකාලික/ අනියම් ............... තනතුරක සේවය කරන බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මුදා හැරිය හැක/ නොහැක.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

07-904

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අගෝස්තු මස 18 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 අගෝස්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ''ව්‍යාපෘති සහායක'' (නොවිධිමත් අධ්‍යාපන/විශේෂ අධ්‍යාපන) තනතුරුධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)**

01. ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුන්ට සිදුවනවා ඇත.

(iii) මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පත්වීම් ලද අදාළ නිලධාරීන්ට පමණි.

03. *විභාග ගාස්තු :*

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පළමු වන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන් පසු වතාවක දී එක් විෂයකට වැඩි ගණනකට හෝ මුළු විභාගය සඳහා පෙනී සිටින්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවක් සහ එක් විෂයකට පමණක් පෙනී සිටින්නේ නම් රුපියල් 250ක විභාග ගාස්තුවක් අය කෙරේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස, දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදු පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් මගින් ඇලවිය යුතුයි. මෙම විභාග ගාස්තුවට අමතරව විභාගය සඳහා අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. තව ද කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.

(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

04. *අයදුම්පත්‍ර :*

අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුයි. මෙම ආදර්ශ අයදුම්පත අනුව ඒ 4, ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත්, වන ලෙස ගෙන සකස්කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම් පත්‍රවල දෙමළවලට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 අගෝස්තු මස 29 වැනි දිනට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, ''ඉසුරුපාය'' අධ්‍යාපන අමාත්‍යාංශය, සහකාර ලේකම් (ආයතන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන ලෙස දන්වමි. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් .-* ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයින් විසින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතරින් කුමක් හෝ භාරගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත;
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත්කළ නොහැකි අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

06. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් යොමුකර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත්කරනවා ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සටහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම් එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

6.1 අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

6.2 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත්කළ යුතුය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. විභාගය පැවැත්වෙනුයේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණි. ඒ අතරින් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

9.1 විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත.

10. *විභාග පරිපාටිය.-* ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. සාමාන්‍ය පරිපාලනය, කාර්යාල කළමණාකරණය | 01 | 100 | පැය 03 |
| 02. මුදල් රෙගුලාසි හා ගිණුම් කටයුතු | 02 | 100 | පැය 03 |
| 03. අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය | 03 | 100 | පැය 03 |
| 04. ඉංග්‍රීසි භාවිතය | 04 | 100 | පැය 03 |

(01) සාමාන්‍ය පරිපාලනය, කාර්යාල කළමණාකරණය :

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය වැඩි අවධානයක් ඇතිව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පළාත් සභා පනත් (සංශෝධන සහිතව)

(ආ) පළාත් සභා විසින් සම්පාදිත ප්‍රඥප්තිය

(ඇ) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්යාල කළමනාකරණය, කාර්යාල ක්‍රම ආයතන සංග්‍රහයේ I, II, III, IV, V, VI, VII, VIII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXI, XXXII, XXXIII, XLVII, XLVIII දරන පරිච්ඡේද

(02) මුදල් රෙගුලාසි හා ගිණුම් කටයුතු :

(අ) රජයේ මුදල් රෙගුලාසි (1 කොටස) (X පරිච්ඡේදය හැර),

(ආ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට වැඩි අවධානය ඇතිව ප්‍රවර්තන වර්ෂයේ ආදායම් හා වැය ඇස්තමේන්තුව, ඒවායේ සැකසීම, ආදායම් ශීර්ෂ මුදල් හා විසර්ජන පනත්,

(ඇ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල මගින් ඉටුකරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදාළ වන ආඥාපනත් සහ වෙනත් නීතිමය විධිවිධාන හා රෙගුලාසි,

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවල භාවිත කරනු ලබන ගිණුම් කාර්ය පටිපාටි,

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ, අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛවල මුදල් හා ගිණුම් අංශවලට අදාළ විධිවිධාන හා ඉදිරියට බලපවත්නා විධිවිධාන හා රෙගුලාසි.

(03) අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය :

(අ) අපේක්ෂකයින් පහත සඳහන් ආඥාපනත් සහ පාර්ලිමේන්තු පනත් පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබිය යුතු ය.

* 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත,
* 1947 අංක 26 දරන සංශෝධිත අධ්‍යාපන ආඥාපනත,
* 1951 අංක 05 දරන සංශෝධිත පනත,
* 1953 අංක 43 දරන සංශෝධිත පනත,
* රජයේ පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය,
* 1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන පනත),
* 1961 අංක 08 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (අතිරේක විධිවිධාන පනත),
* 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත,
* 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධිත) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත,
* 1979 අංක 64 දරන පිරිවෙන් පනත හා ඒ යටතේ නිකුත් කර ඇති රෙගුලාසි,
* 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) සංශෝධිත පනත,
* 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
* 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත,
* 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරි පනත,
* අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි,
* ළමා අයිතිවාසිකම් හා කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පනවනු ලැබූ අණපනත් සහ නීතිවල සංශෝධන,
* ළමා අධිකාරි පනත සහ ඉදිරියට බලපවත්නා පනත් පිළිබඳව.

(ආ) අධ්‍යාපන පරිපාලනය

* අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති,
* පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්,
* ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් අධ්‍යාපනික සැලසුම් සකස් කිරීම,
* පරමාර්ථ ක්‍රම (පාසල් සැලසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය,
* පාසල් කළමනාකරණය හා පාසල් ප්‍රජා සම්බන්ධතා,
* අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධති,
* විශේෂ අධ්‍යාපන වැඩ සටහන්.

(ඇ) අධ්‍යාපන අධීක්ෂණය :

* පාසල් අධීක්ෂණය සඳහා ක්‍රම හා ගුරුවරුන්ගේ කාර්ය සාධන ඇගයීම සඳහා උපයෝගී කර ගන්නා උපමාන (වෘත්තීය සමාලෝචන හා ප්‍රති පුහුණු වැඩ සටහන්).
* පාසල්වල අඛණ්ඩ ඇගයීම් වැඩ සටහන්.
* පාසල්වල ස්වයං ඇගයීම් වැඩ සටහන්.
* පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් අධීක්ෂණය කිරීම.
* බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය.

(ඈ) නොවිධිමත්, සන්තතික සහ විශේෂ අධ්‍යාපන පරිපාලනය සංවර්ධනය හා අධීක්ෂණය (අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට උපදෙස් දෙනු ලැබේ.)

(04) ඉංග්‍රීසි භාවිතය :

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අතර තත්ත්වයේ ප්‍රායෝගික භාවිතය,

* සන්නිවේදන දක්ෂතා
* ව්‍යාපාරික ලිපි
* දෙබස්
* ඉල්ලුම්පත්
* සම්මුඛ පරීක්ෂණ
* වාර්තා
* සරල ඡේදයක අර්ථය පැහැදිලි වී ඇත්දැයි බැලීමට කෙටි ප්‍රශ්න

**(සාමාර්ථය ලැබීම සඳහා එක් එක් විෂයයේ ලකුණුවලින් අවම වශයෙන් 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් නිලධාරියා විසින් ලබා ගත යුතු වේ.)**

11. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

තිස්ස හේවාවිතාන,
ලේකම්, (වැ. බ.)
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017 ජූලි මස 07 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
''ඉසුරුපාය'',
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**අධ්‍යාපන අමාත්‍යාංශයේ ''ව්‍යාපෘති සහායක'' (නොවිධිමත් අධ්‍යාපන/විශේෂ අධ්‍යාපන) තනතුරුධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2016 (2017)**

**The First Efficiency Bar Examination for "Project Assistant" (Non formal Education/Special Education) in the Ministry of Education - 2016 (2017)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

සිංහල - 2
දෙමළ - 3

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(උදා. HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):———.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. සේවා ස්ථානය හා ලිපිනය :
2.1 සේවා ස්ථානයේ නම :————.
2.2 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ)

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. දැනට දරන තනතුර (පත්වීම් ලිපියේ සඳහන් පරිදි) :——.
5.1 පත්වීම් ලිපියේ අංකය :————.
5.2 පත්වීම් දිනය :————.

06. ඔබ ඉදිරිපත්වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන් (ගැසට් නිවේදනයේ 10 වැනි ඡේදය බලන්න) :

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

07. විභාග ගාස්තුව (අදාළ නම් පමණි.)
I. ගෙවන ලද මුදල : රු.
II. ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :
III. ගෙවූ දිනය :
IV. ලදුපත් අංකය :

ලදුපතෙහි එක් දාරයකින් මෙහි අලවන්න.
(අදාළ නම් පමණි.) (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

ඉහත විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරන අතර, මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ
අත්සන.

දිනය :————.

**සටහන** - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියෙකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන …………………….. මයා./මිය./මෙනවිය ………. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බව ද/නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————————,
අත්සන සහතික කරන්නාගේ අත්සන
හා නිල මුද්‍රාව.
(ආසන්නතම මාණ්ඩලික නිලධාරියා)

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් ඇති බවත්,
3. නිලධාරියා/නිලධාරිණිය මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බව/නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/
පීඨාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(අදාළ නොවන වචන කපා හරින්න)

07-782

---

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන
ඛණ්ඩ - 02ට අයත් තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - 2017

01. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු විවෘත පදනම මත පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
   - වෛද්‍ය සැපයීම් සහකාර
   - ආහාර නිරීක්ෂිකා
   - නිවාස භාරකරු/භාරකාරිනී.

02. *තනතුරු සඳහා අදළ අධ්‍යාපන සුදුසුකම් :-*

(අ) නිවාස භාරකරු/භාරකාරිනී තනතුර :
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;
සහ
අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

(ආ) ආහාර නිරීක්ෂිකා .- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ ගෘහ විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;
සහ
අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

(ඇ) වෛද්‍ය සැපයීම් සහකාර .- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;
සහ
වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට පමණක් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී රසායන විද්‍යා විෂය සමත්වී තිබිය යුතුය.

03. *පළපුරුද්ද :*
   - ආහාර නිරීක්ෂිකා සහ වෛද්‍ය සැපයීම් සහකාර තනතුරු සඳහා අදළ නොවේ.
   - නිවාස භාරකරු/භාරකාරිනී තනතුර සඳහා රජයේ අනුබද්ධ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක නේවාසිකාගාරයේ භාරකරු වශයෙන් අවු. 02ක පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.
   - නිවාස භාරකරු/භාරකාරිනී තනතුරට බඳවා ගැනීමට සුදුසුකම් ලබන්නන් සඳහා මසක ආයතනික පුහුණුවක් ලබාදෙනු ලැබේ.

04. *වෘත්තීය සුදුසුකම් :-*
   - ආහාර නිරීක්ෂිකා සහ නිවාස භාරකරු/භාරකාරිනී තනතුරු සඳහා අදළ නොවේ.
   - වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට පමණක් පරිගණක වදන් සැකසුම්/යතුරු ලියනය/ලඝුලේඛනය පිළිබඳ තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් මාස 06ට නොඅඩු පාඨමාලාවක් හදරා තිබිය යුතුය.

**සටහන.**-ආහාර නිරීක්ෂිකා තනතුරට තෝරාගනු ලබන අයදුම්කරුවන්ට මාස 03ක පුහුණුවක් ලබා දේ. එම පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වන අය ආහාර නිරීක්ෂිකා තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ. පුහුණුව අවසානයේ දී පවත්වනු ලබන පරීක්ෂයෙන් අසමත් වන අයගේ සේවය අත්හිටුවනු ලැබේ. පුහුණුව සඳහා දීමනාවක් ගෙවනු නොලැබේ.

05. *අනෙකුත් පොදු සුදුසුකම් :*
*(අ)* 2017.08.28 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
*(ආ)* වෛද්‍ය සැපයීම් සහකාර තනතුරට අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණක් වන අතර ආහාර නිරීක්ෂිකා තනතුරට අයදුම් කළ හැක්කේ කාන්තාවන්ට පමණි.
*(ඇ)* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
*(ඉ)* අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
*(ඊ)* අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
*(උ)* ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

06. *අයදුම් කළ යුතු ක්‍රමය :*

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අකෘතියට අනුකූලව ඒ - 4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් මුල් පිටුවට අංක 1.0 සිට 5.1 දක්වාත්, දෙවන පිටුව 5.2 සිට 8.0 දක්වාත් , අකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

*(ආ)* අයදුම්පතෙහි ''ලදුපත'' යන ස්ථානයේ, ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට රු. 500 බැර කර එම ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයේ අදළ ස්ථානයේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට ප්‍රථම එහි පිටපතක් තබා ගන්න.

*(ඇ)* අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්-පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිළධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 334,452 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කල යුතුය.

*(ඈ)* නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ ....... තනතුරට බඳවා ගැනීම 2017'' යනුවෙන් සඳහන් කර 2017.08.28 වැනි දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 03, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ''සුවසිරිපාය'', අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

07. දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිළධාරීන් මේ සඳහා අයදුම් කරන්නේ නම් එම නිළධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

08. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් කොන්දේසිවලට හා ආදර්ශ අයදුම්පත්‍රයට අදළ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාවය සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් අනතුරුව ඉහත සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව III වන ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ.

තෝරා ගන්නා අයදුම්කරුවන්ට පමණක් ලිපියකින් දැනුම් දෙන අතර ප්‍රතිඵල ලැයිස්තුව www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලැබේ.

10. ලිඛිත විභාගය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:-

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| (i) සාමාන්‍ය දැනීම | අදල ක්ෂේත්‍රය ඇසුරින් තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | පැය 02 | 100 | 40% |
| (ii) බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය▫ ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |

*(අ)* සෑම ලිඛිත උත්තර පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ.
*(ආ)* ඉහත එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40%ක් වත් ලබා ගත යුතු වේ. කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුව ම පත් කිරීම් කරනු ලැබේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-*
සෑම අතින්ම නිවැරදි අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
3. වලංගු රියදුරු බලපත්‍රය.

12. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-*
*(අ)* ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ.
*(ආ)* මෙම තනතුරට පත්වන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
*(ඇ)* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදළ ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.
*(ඈ)* වසර 03 ක් ගත වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය.
*(ඉ)* තෝරාගනු ලබන අයදුම්කරුවන් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 02 සේවා ගණයේ බඳවා ගැනීමේ පරිපාටියට හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පටිපාටික රීති, හා රජය විසින් නිකුත් කරනු ලබන නියෝග හා රෙගුලාසි වලටද යටත් විය යුතුය.

13. තනතුරු වලට පත් කරනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පවතින පුරප්පාඩු මත එම තනතුරේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට කටයුතු කෙරේ. ආහාර නිරීක්ෂිකා, නිවාස භාරකරු/භාරකාරිනී සහ වෛද්‍ය සැපයීම් සහකාර තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN-01-2016 වැටුප් පරිමාණය රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 හිමිවන අතර වැටුප් ගෙවීම එම චක්‍රලේඛයේ උපලේඛන II ට අනුව සිදු කරනු ලැබේ.

14. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති, අසම්පූර්ණ ලෙස තොරතුරු සටහන් කර ඇති, හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථානගතවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

15. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතුය. පත්වීම් ලැබීමෙන් පසු සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම් අවලංගු කර තනතුරෙන් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුලත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

16. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය සෞඛ්‍ය ලේකම් සතුය.

17. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ජනක සුගතදස,
ලේකම්.
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2017 ජූලි මස 10 වැනි දින,
''සුවසිරිපාය''
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10,

**ආදර්ශ අයදුම්පත්‍රය**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පවතින කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ - 2 [MN-01-2006 (ඒ)] සේවා ගණයට අයත් තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම -2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 1,
දෙමළ - 2,
ඉංග්‍රීසි - 3
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

විභාගය සඳහා ඉල්ලුම් කරන තනතුර සහ මනාපය
1. ..........................
2. ..........................
3. ..........................

01. (a) අයදුම්කරුගේ මුල්'කුරු සමඟ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා :- SILVA A. D.
Mr./Mrs./Miss :———.
(b) සම්පූර්ණ නම :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(c) සම්පූර්ණ නම :- (සිංහලෙන්/දෙමළෙන්) :———.

02. (i) ස්ථිර ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(ii) ස්ථිර ලිපිනය :- (සිංහලෙන්/දෙමළෙන්) :———.
(iii) පදිංචි දිස්ත්‍රික්කය :——. (iv) දුරකථන අංකය :——.
(v) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

03. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය: ☐☐

(i) ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :–

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද යන වග : ඔව් ☐ නැත ☐

(අදාල කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)

05. අධ්‍යාපන සුදුසුකම් : (අදල සහතික ඇමිණිය යුතුය.)

(i) අ. පො. ස. (සා. පෙ.) විභාගය : විභාග අංකය :——.
වර්ෂය :———.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 05 | | |
| 02 | | | 06 | | |
| 03 | | | 07 | | |
| 04 | | | 08 | | |

(ii) අ. පො. ස. (උ.පෙ.) විභාගය : විභාග අංකය :———.
වර්ෂය :———.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 03 | | |
| 02 | | | 04 | | |

(iii) පලපුරුද්ද :- ඇත ☐ නැත ☐

(අදළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)

අදළ විස්තර සඳහන් කරන්න. (සහතික මඟින් සනාථ කළ යුතුය.) :———.

(iv) වෘත්තීය සුදුසුකම් (තනතුරට අදළව) :

ඇත ☐ නැත ☐

(අදළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.) අදළ විස්තර සඳහන් කරන්න. (සහතික මඟින් සනාථ කළ යුතුය.) :———.

06. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් ☐ නැත ☐

(අදළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)
ඔව් නම් විස්තර සපයන්න. :———.

07. *අයදුම්කරුගේ සහතිකය :*
මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරාගැනීමට පෙර නම් මෙම අයදුම්පත අවලංගු වන බවද, තෝරාගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද, පිළිගනිමි.

| මුදල් ගෙවන ලද ලදුපත මෙහි අලවන්න. එහි ඡායා පිටපතක් ළඟ තබාගන්න. |
|---|

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ................. දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

———,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිලමුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

07-848

---

**ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)**
සමාජ සේවා විද්‍යාලය

(සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය)
මෙම ආයතනය විශ්වවිද්‍යාල කොමිෂන් සභාව යටතේ උපාධි ප්‍රදනය කරනු ලබන ආයතනයක් ලෙස 1978 අංක 16 දරන පනත යටතේ 25A අංශය යටතේ පිළිගෙන ඇත.

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
(MSW) -2017/2018

ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම පාඨමාලාව සඳහා මෙරට හා සාක්රටවල අයදුම්කරුවන්ට ඉල්ලුම් කළ හැක.

ජාතික සමාජ සංවර්ධන ආයතනය, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවත්නා උසස් අධ්‍යාපන ආයතනයකි. ඉහත අයදුම්පත් කැඳවා ඇත්තේ මෙම පාඨමාලාවේ හත්වන කණ්ඩායම බඳවාගැනීම සඳහායි.

මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ, සමාජ සංවර්ධනයට විශේෂයෙන්ම සමාජ සුභසාධන ක්ෂේත්‍රය තුළ හා ආයතන අතර සම්බන්ධීකරණයට අවශ්‍ය වෘත්තීමය හා කළමනාකාරීත්වයට අවශ්‍ය මිනිස් බල ශ්‍රමය සැපයීමය.

*ඇතුළත්වීමේ සුදුසුකම් :*

අයදුම්කරුවන් මෙම පාඨමාලාවට ඇතුළුවීම සඳහා පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

- පිළිගත් විශ් වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පිරිනමනු ලැබූ පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිත ශාස්ත්‍රවේදී උපාධිය

හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පිරිනමනු ලැබූ සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය සමග අවම වශයෙන් වර්ෂයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පිරිනමනු ලැබූ සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය සමග සමාජ සුභසාධන ක්ෂේත්‍රය තුළ අවුරුදු 3ක වැඩකිරීමේ පළපුරුද්ද.

හෝ

- ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන සභාව මගින් පිළිගනු ලබන ශාස්ත්‍රවේදී උපාධියට සමාන සුදුසුකම්ලත් පාඨමාලාවන් සමග සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ වර්ෂ 3ක වැඩ කිරීමේ පළපුරුද්දක් තිබීම.

සහ

- ඉංග්‍රීසියෙන් වැඩ කිරීමේ හැකියාව

| | | |
|---|---|---|
| මාධ්‍යය | : | ඉංග්‍රීසි |
| කාලය | : | අධ්‍යයන වර්ෂ 02 (සිකුරාද සවස සහ සෙනසුරාද දිනයම) |
| පාඨමාලා ගාස්තු | : | රු. 2,27,000 |

වැඩිදුර තොරතුරු හා අයදුම්පත්‍ර ආයතනයේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. (www.nisd.lk) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017.08.15 දිනට පෙර ලේඛකාධිකාරී, ජාතික සමාජ සංවර්ධන ආයතනය, 488ඒ, නාවල පාර, රාජගිරිය යන ලිපිනයට තැපැල් කරන්න.

සාක් රටවල අයදුම්කරුවන් සඳහා පාඨමාලා ගාස්තු ඉල්ලීම මත තීරණය කරනු ලැබේ.

අයදුම්පත්‍රය සමග පහත සහතිකවල පිටපත් අමුණන්න.

- උපාධි සහ අනිකුත් සහතිකවල සහතික කරන ලද පිටපත්
- වැඩ කිරීමේ පළපුරුද්ද සහතික කළ ආයතන ප්‍රධානියාගේ ලිපිය

අයදුම්පත්‍රය සමග ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවර "සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය - 2017-2018" යන්න සඳහන් කරන්න.

ජාතික සමාජ සංවර්ධන ආයතනය

දුරකථන අංක : 0112 882506/7, 0112076021
ෆැක්ස් අංකය : 0112882502
ඊමේල් : nisd@slt.lk
වෙබ් : www.nisd.lk

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

07-859

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**
ප්‍රසම්පාදන නිවේදනය

බර ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 18 ක් සහ සැහැල්ලු ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 16 ක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ප්‍රසම්පාදනය කිරීම

01. බර ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 18 ක් සහ සැහැල්ලු ට්‍රොලි රථ සඳහා රෝද සහිත ඇක්සල් 16ක් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතෙහි, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

ලංසුකරුවන්ට ඔවුන්ගේ ලංසු ඍජුවම හෝ ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රයක් මගින් බලය පවරනු ලැබූ පිළිගත් නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකිය.

02. ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකාවෙහි කොළඹ 10, ඕල්කට් මාවතෙහි, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ පිටරට දූත මණ්ඩල මාර්ගයෙන්, රු. 1,500 ක ආපසු නොගෙවන ලේඛන ගාස්තුවක් හෝ ඒ හා සමාන පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදලක් ගෙවීමෙන් 2017.08.28 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ලබාගත හැකි පෝර්මවල පමණි.

03. 2017.08.29 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වෙයි.

04. රෝද සහිත ට්‍රොලි ඇක්සල් සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ සැපයීම සිදුකළ යුත්තේ ISO 9001 : 2008 සහතික ලත් සමාගම් හෝ මිලදී ගනු ලබන්නාට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර තත්ව කළමනාකරණ ඇති සමාගම් විසින් පමණි.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතෙහි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කිරීම සිදුකරනු ලැබේ. ලංසු තබන්නන්හට හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙසට ආරාධනය කරනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම සිදු කළ යුතු ය :

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කට් මාවත, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

07. ලංසු ලියකියවිලි පරීක්ෂාකර ගාස්තු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතෙහි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී සිදුකළ හැකි ය.

08. වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න :
දුම්රිය ගබඩා අධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථනය : 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් : srs.sir@gmail.com
වෙබ් අඩවිය - www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7481

07-854

---

## බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - කළුතර**

අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙම පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2017.08.17 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හා මුදල් ඇනවුම් භාර ගනු නොලැබේ.

වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත මගින් තහවුරු කළ යුතු ය.

එච්. එම්. බී. ආර්. විජේරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කළුතර.

2017 ජුනි මස 14 වැනි දින,
කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* |
|---|---|---|
| 01. | 38424 | 205-1994 දරන ත්‍රීරෝද රථය (ලි. ප. කළ නොහැක) |
| 02. | 48476 | WPSL 8254 දරන අත් ට්‍රැක්ටරය (ලි. ප. කළ නොහැක) |
| 03. | 31646 | 45 ශ්‍රී 2266 දරන ට්‍රැක්ටර් ට්‍රේලරය (ලි. ප. කළ නොහැක) |
| | | 325 - 1580 දරන ට්‍රැක්ටරය (ලි. ප. කළ නොහැක) |
| 04. | 04975 | WPSF - 4463 දරන අත් ට්‍රැක්ටරයක කොටස් (ලි. ප. කළ නොහැක) |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 05. | 51169 | WPLE - 0091 දරන ලොරි රථය (ලි. ප. කළ නොහැක) |
| 06. | 56243 | 27-2042 දරන ලොරි රථය (ලි. ප. කළ නොහැක) |
| 07. | 96542 | 141-1328 දරන යතුරුපැදිය (ලි. ප. කළ නොහැක) |
| 08. | 83207 | මෝපේඩ් වර්ගයේ යතුරුපැදිය (ලි. ප. කළ නොහැක) |
| 09. | 54430 | 28 - 6701 දරන ලොරි රථය (ලි. ප. කළ නොහැක) |
| 10. | 43071 | AAF - 6870 දරන ත්‍රිරෝද රථය (ලි. ප. කළ නොහැක) |
| 11. | AR/3498/15 | MU 5105 දරන යතුරු පැදිය (ලි. ප. කළ හැක) |
| 12. | 34693 | මන්න පිහිය |
| 13. | 00597 (BR 6154/12) | මන්න පිහිය |
| 14. | BR/1157/10 | මන්න පිහිය |
| 15. | 49187 ( BR/995/14) | මන්න පිහිය |
| 16. | 49177 ( BR/9923/13) | කැත්තක් |
| 17. | 23266 ( BR/8852/13) | මන්න පිහිය |
| 18. | 44298 ( BR/3131/14) | මන්න පිහිය |
| 19. | 16924 ( BR/8026/13) | කැසට් රේඩියෝ එකයි |
| 20. | 49795 ( BR/3078/14) | සවල් එකයි |
| 21. | 21282 ( BR/7044/12) | කියතක් |
| 22. | 10729 | අත්ට්‍රැක්ටරය පනගන්වන උපකරණය (හැඩලය) |
| 23. | BR/5027/15 | මන්න පිහිය |
| 24. | BR/8986/13 | ලා නිල් පාට කැඩීගිය කම්ප්‍රෙෂර් කොටසක් මෝටරයක් |
| 25. | 92622 | මන්න පිහිය |
| 26. | AR/194/17 | වාහන ටයරයක් |
| 27. | 00064( BR/5409/12) | මල්පෝච්චි 02, අලවංගු 01යි |
| 28. | AR/9102/14 | අලවංගු දෙකයි |
| 29. | AR/2477/15 | වැල්ඩින් කූරු පැකට් 01යි |
| 30. | 40981 | ත්‍රිරෝද රථයක රෝදයක් |
| 31. | 68111 | ලිට්රෝ 2.3 Kg ගෑස් සිලින්ඩරය |
| 32. | BR/102/09 | රූපවාහිනී යන්ත්‍රයක් |
| 33. | AR/4942/16 | කැඩුණු ගුවන් කැමරාවක් |
| 34. | 12129 | රූපවාහිණී යන්ත්‍රයක් |
| 35. | 64796 | යකඩ බාල්දියක් සහ කඹයක් |
| 36. | AR/4943/16 | ගෑස් සිලින්ඩරයක් |
| 37. | 54036 | අඩි 18ක් දිග යකඩ බට 02යි සහ යකඩ පටි කිහිපයක් |
| 38. | AR/5029/16 | PR 264/2016 ඇතුළත් D. S. T. 31 K සඳහන්ව ඇති රතු පැහැති පා පැදිය |
| 39. | PR/265/2016 | ඇතුලත් GIANT ලෙස සඳහන් ව ඇති සුදු, කළු අළු පැහැති ෂීට් එක නොමැති පා පැදි 01යි |
| 40. | - | PR266/2016 ඇතුළත් FING JAPAN ලෙස සඳහන් නිල්පාට sport පාපැදිය |
| 41. | - | PR267/2016 ඇතුළත් TOMAHWK ලෙස සඳහන් sport නිල් පැහැති ඉදිරිපස කූඩයක් ඇති අළුපාට පාපැදිය |
| 42. | - | PR270/2016 ඇතුළත් ඉදිරිපස කූඩයක් සහිත අළුපාට පාපැදිය |
| 43. | - | PR 268/2016 ඇතුළත් PRECISION ලෙස සඳහන් ව ඇති කළුනිල් පැහැති sport වර්ගයේ පා පැදි 01යි |
| 44. | - | PR 272/2016 ඇතුළත් රතුපාට sport වර්ගයේ පා පැදිය |
| 45. | - | PR 274/2016 ඇතුලත් අළු රතු වර්ණයෙන් යුතු ඉදිරිපස කූඩයක් සහිත පාපැදිය |
| 46. | - | PR 275/2016 ඇතුළත් කළු පැහැති පා පැදිය |
| 47. | - | PR 276/2016 ඇතුළත් LUMAKA ACTIVE ලෙස සඳහන් sport වර්ගයේ පාපැදිය |
